T- 73

# මනෝරෝග පිළිබඳ බෞද්ධ චිකිත්සාව

(ත්‍රිපිටක සාහිත්‍යයෙහි පැනෙන මනෝවිශ්ලේෂණය
හා චර්යා විද්‍යාත්මක ප්‍රතිකාර පිළිබඳ අධ්‍යයනයක්)

ලියාපදිංචි අංකය ඃ- 2003/p.h.D/599

නම ඃ- P.R. වසන්ත ප්‍රියදර්ශන

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත්
උපාධි ආයතනයේ දර්ශනශූරී උපාධිය සඳහා
ඉදිරිපත්කරන ස්වාධීන නිබන්ධය

## නිබන්ධ සාරාංශය

බෞද්ධ මනෝරෝග චිකිත්සාව - ත්‍රිපිටක සාහිත්‍යයෙහි පැනෙන මනෝවිශ්ලේෂණය හා චර්යාවිද්‍යාත්මක ප්‍රතිකාර පිළිබඳ අධ්‍යනයක් නමැති මෙම දර්ශනශූරී නිබන්ධනයෙහි ප්‍රධාන පරිච්ඡේද හතක් ඇතුළත්ය. මෙම පරිච්ඡේද හත මගින් මූලික අවධානය යොමුකොට ඇත්තේ බුදුසමයෙහි අන්තර්ගත මනෝරෝග චිකිත්සාමය සංකල්ප මනාව විවරණය කිරීම ය. එම විවරණය වඩාත් සාර්ථක කරගනු වස් දෙවන පරිච්ඡේදය මගින් බටහිර මනෝ රෝග චිකිත්සාවේ ස්වභාවය ද ගෙනහැර දක්වන්නට විය.

මනෝරෝග චිකිත්සාව යන්නෙනි සරල අර්ථය නම් මනස සුවපත් කිරීම නැතහොත් මනස රැකබලා ගැනීම යන්නය. මනස පිළිබඳ ගැඹුරු අවබෝධයකින් තොරව මානසික ගැටලු නිරාකරණය කිරීම සඳහා මැදිහත් විය නොහැක. පළමු පරිච්ඡේදය මගින් සාකච්ඡාවට භාජනය කොට ඇත්තේ මනෝරෝග සම්බන්ධයෙන් මැදිහත්වීමට බුදුසමයට ඇති හැකියාවය. පුද්ගලයා පිළිබඳ පැහැදිලි අවබෝධයකින් තොරව ඔහු හෝ ඇයට වැළඳෙන කායික හෝ මානසික රෝග සම්බන්ධයෙන් ප්‍රතිකාර නිර්දේශ කිරීමට ඉදිරිපත්වීම සදාචාර විරෝධී ක්‍රියාවකි. මනෝරෝග චිකිත්සාවේ හෝ වෛද්‍ය විද්‍යාවේ සත්චරිත්‍ර ධර්මවලට එරෙහිව යාමකි. ඒ නිසා පළමු පරිච්ඡේදය මගින් මූලික වශයෙන් පුද්ගලයා, මනස, කය හා මනස අතර සම්බන්ධය, කායික රෝගාබාධ සුවපත් කිරීම, පුද්ගල පෞරුෂය යනාදී මාතෘකා යටතේ බෞද්ධ මනෝවිද්‍යාවේ මූලික සංකල්පය පිළිබඳව විවරණයක් ගෙනහැර දක්වන්නට විය.

බටහිර වෛද්‍ය විද්‍යාවේ මානසික කෂේත්‍රය නියෝජනය වන්නේ මනෝචිකිත්සාව මගිනි. මනෝචිකිත්සාව යටතේ ක්‍රියාත්මක වන විෂය ක්ෂේත්‍ර දෙකකි. මනෝරෝග චිකිත්සාව විධිමත් ලෙසත් විද්‍යාත්මක න්‍යාය අනුසාරයෙන් දැනට ක්‍රියාත්මක වන්නේ බටහිර මනෝරෝග චික්ත්සාව යටතේ පමණකි. එබැවින් බටහිර මනෝචික්ත්සාවේ විෂය පථය නිවැරදිව හඳුනා ගැනීම බෞද්ධ මනෝරෝග චික්තාසාවේ සුවිශේෂත්වය වටහාගැනීමට මනා පිටුවහලක් සැපයීමට හේතු වේ. ඒ නිසා දෙවන පරිච්ඡේදය බටහිර මනෝරෝග චිකිත්සාවේ ස්වභාවය විවරණය කිරීම සඳහා වෙන්කොට ඇත.

මෙම පර්යේෂණ නිබන්ධය උදෙසා අදාළ යෝජිත මාතෘකාව ඉදිරිපත්කිරීමේදී පැනනැගුණු මූලික ගැටලුව වූයේ මනෝරෝග පිළිබඳ බෞද්ධ චිකිත්සාව දර්ශනශූරී උපාධිය හැදෑරීම සඳහා මා සතුව කොතෙක් දුරට මනෝචිකිත්සාව නමැති විෂය පථය පිළිබඳ ප්‍රාමාණික අවබෝධයක් පවතීද යන්නයි. එම ගැටලුවට පිළියම් වශයෙන් මම වසර දෙකක පමණ කාලයක් කොළඹ විශ්වවිද්‍යාලය අධ්‍යාපන පීඨය මඟින් හඳුන්වා දී තිබූ මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා හැදෑරීමට යොමු වූයෙමි. ඉන් අනතුරුව ශ්‍රී ලංකා විද්වත් වෘත්තිකයන්ගේ උපදේශකවරුන්ගේ සංගමයෙහි ***(Sri Lanka Institute Of Professional Counsellors)*** අංක 2005/574 නිල සාමාජිකත්වය යටතේ වෘත්තීය උපදේශකවරයෙකු ලෙස කටයුතු කළෙමි. එසේ ලැබූ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම සේම අදාළ මූලාශ්‍ර භාවිතයෙන් දෙවන පරිච්ඡේදය පෝෂණය කළ අතර එමගින් තව දුරටත් බටහිර මනෝරෝග චිකිත්සාවේ ස්වභාවය ගෙන හැර දක්වා ඇත. මානසික රෝගින් උදෙසා මනෝවිද්‍යා උපදේශකවරයෙකු ලෙස ලැබූ එම න්‍යායාත්මක හා ප්‍රායෝගික අත්දැකීම් සම්භාරය ත්‍රිපිටක සාහිත්‍යයෙහි පමණක් නොව සිංහල ගැමි අභිචාර විධි හා සබැඳි මනෝරෝග චික්ත්සාමය වටිනාකම පවා මනාව හඳුනා ගැනීමට ද මහෝපකාරී වූ බව සඳහන් කළ යුතු මනාය.

තෙවන පරිච්ඡේදය යටතේ මූලික අවධානය යොමුකරන්ට වූයේ මනෝව්‍යාධිවේදය පිළිබඳ බෞද්ධ ආකල්පය විග්‍රහකිරීමටය. ත්‍රිපිටක සාහිත්‍යයෙහි දැක හඳුනාගත හැකි මනෝවිකෘතිතා සහ අසාමාන්‍ය චර්යාවන්ගෙන් හෙබි විවිධ වූ මානසික රෝගීන් පිළිබඳ එකතුවක් ද මෙම පරිච්ඡේදයට අන්තර්ගත කොට ඇත. ත්‍රිපිටක සාහිත්‍යයට පමණක් සීමා වූවත් අදාළ අතිරේකාර්ථ සම්පාදනය කර ගැනීම සඳහා අටුවා සාහිත්‍යයද යම්තාක් දුරට ඇසුරු කළ බව සඳහන් කළ යුතුය. ඒ අනුව විශුද්ධිමාර්ගයෙහි අන්තර්ගත චරිත විශ්ලේෂණය දෙසට වැඩි අවධානයක් යොමුකොට ඇත.

නූතන බටහිර මනෝරෝග චිකිත්සාව සම්බන්ධයෙන් ඉදිරිගන්වන්නා වූ බරපතල චෝදනාව වන්නේ මනෝ චිකිත්සකයින් අදාළ සත්චාරිත්‍ර ධර්ම නිසියාකාරව ක්‍රියාත්මක නොකරන්නේය යන්නයි. සියලුම මනෝචිකිත්සකයින් උදෙසා ආගම් භේදයකින් තොරව සම්ප්‍රදාය භේදයකින් තොරව භාවිතයට ගත හැකි සත්චාරිත්‍ර ධර්ම පද්ධතියක් බුදුසමයෙහි අන්තර්ගතව

පවතින බව පෙන්වා දීම සඳහා සිව්වන පරිච්ඡේදය වෙන් කොට ඇත. මනෝරෝග චිකිත්සාව සම්බන්ධයෙන් කොතෙක් දුරට න්‍යායාත්මක හා ක්ෂේත්‍ර අත්දැකීම් අත්පත්කරගන්නේ නමුදු බෞද්ධ මනෝරෝග චිකිත්සකයෙකු විය නොහැක. එමෙන්ම සිව්වන පරිච්ඡේදය මගින් තවදුරටත් මනෝරෝග චිකිත්සකයෙකු සතුවිය යුතු ප්‍රාරම්භක කුසලතා මොනවාද යන්න පිළිබඳ ව ද විවරණයක් ඉදිරිපත් කෙරේ. බුදු සමය ඉතා පැහැදිලිවම න්‍යායාත්මක (විජ්ජා) සහ ප්‍රායෝගික (චරණ) ක්ෂේත්‍ර සමඟ පෝෂණය වූ ධර්ම මාර්ගයකි. පස්වන පරිච්ඡේදය යටතේ සාකච්ඡාවට බඳුන්කොට ඇත්තේ බෞද්ධ මනෝරෝග චිකිත්සාව හා සබැඳි න්‍යායාත්මක හා ප්‍රායෝගික ක්ෂේත්‍ර ය. බෞද්ධ දර්ශනය අනුසාරයෙන් සබ්බාසව සූත්‍රයෙහි හා බෞද්ධ සංස්කෘතිය සම්බන්ධයෙන් ගිහි පැවිදි උපෝසථය, පිරිත සහ බෝධි පූජා සැලකිල්ලට ගනිමින් අදාළ මනෝරෝග චිකිත්සාමය වටිනාකම් විචාරාත්මක පෙන්වා දී ඇත. හයවන පරිච්ඡේදය බෞද්ධ මනෝරෝග චිකිත්සාව වර්තමාන සමාජ සන්දර්භය තුළ ක්‍රියාත්මක කිරීමේ න්‍යායාත්මක සැලැස්ම පැහැදිලි කරන අතර අවසාන පරිච්ඡේදය බටහිර හා බෞද්ධ මනෝරෝග චික්සාවේ සමවිෂමතා සාකච්ඡා කිරීම සඳහා වෙන් කොට ඇත.